ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# 1993 අංක 17 දරන
# පළාත් සභා විශ්‍රාම වැටුප් පනත

---

[සහතිකය සටහන් කළේ 1993 මාර්තු මස 31 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1993 අප්‍රේල් මස 02 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබා ගත හැක.

මිල : ශත 60 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1993 අංක 17 දරන පළාත් සභා විශ්‍රාම වැටුප් පනත

[සහතිකය සටහන් කළේ 1993 මාර්තු මස 31 වන දින]

එල්. ඩී.—ඕ. 58/91

**පළාත් රාජ්‍ය සේවාවල නිලධරයන්ට සහ පළාත් සභාවල ලේකම් කාර්ය මණ්ඩලයට විශ්‍රාම වැටුප් ගෙවීම සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.**

1. මේ පනත 1993 අංක 17 දරන පළාත් සභා විශ්‍රාම වැටුප් පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය.

**වැන්දඹු හා අනත් දරු විශ්‍රාම වැටුප් අරමුදල් ආඥාපනත, 1983 අංක 24 දරන වැන්දඹු පුරුෂ සහ අනත් දරු විශ්‍රාම වැටුප් අරමුදල පනත සහ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය පළාත් රාජ්‍ය සේවයේ නිලධරයන්ට සහ පළාත් සභා ලේකම් කාර්ය මණ්ඩලයට අදාළ වීම.**

2. (1) අමාත්‍යවරයා විසින් පළාත් සභා විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, ප්‍රකාශනයක් මගින්, අවශ්‍යාවෝචිත පරිදි පළාතක පළාත් රාජ්‍ය සේවයේ හෝ පළාත් සභාවක ලේකම් කාර්ය මණ්ඩලයේ යම් තනතුරක්, එම ප්‍රකාශනයේ නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයක සිට ක්‍රියාත්මක වන පරිදි විශ්‍රාම වැටුප් සහිත තනතුරක් බව ප්‍රකාශ කළ හැකිය. (එසේ නිශ්චිතව සඳහන් කරනු ලබන දිනය නියමිත දිනයට පූර්වයෙන් වූ දිනයක් විය හැකිය. තවද, ඒ අනුව එවැනි යම් තනතුරක සේවය, එම සේවය නියමිත දිනයට පෙර වුවද පසුව වුවද, විශ්‍රාම වැටුප් සහිත තනතුරක සේවය වශයෙන් සලකනු ලැබිය යුතු ය.)

(2) විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය, වැන්දඹු හා අනත් දරු විශ්‍රාම වැටුප් අරමුදල් ආඥාපනත සහ 1983 අංක 24 දරන වැන්දඹු පුරුෂ සහ අනත් දරු විශ්‍රාම වැටුප් අරමුදල පනත, මේ පනතේ විධිවිධානවලට යටත්ව, (1) වන උපවගන්තිය යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් බවට ප්‍රකාශිත තනතුරක් දරන්නකු කෙරෙහි හා සම්බන්ධයෙන් එම ව්‍යවස්ථා සංග්‍රහයේ හෝ ආඥාපනතේ හෝ පනතේ අර්ථානුකූලව, අවශ්‍යාවෝචිත පරිදි, ඒ තනතුර දරන්නා රාජ්‍ය සේවකයකු හෝ රාජ්‍ය නිලධරයකු වූවාක් සේ අදාළ විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් බවට ප්‍රකාශිත, පළාතක පළාත් රාජ්‍ය සේවයේ හෝ පළාත් සභාවක ලේකම් කාර්ය මණ්ඩලයේ, තනතුරක් දරන තැනැත්තකු ඔහු එම තනතුරට පත් කරනු ලැබීමට පෙරාතුව—

(අ) විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් වශයෙන් ප්‍රකාශිත රජයේ තනතුරක් දරන්නකුව ; හෝ

(ආ) 1974 අංක 10 දරන පළාත් පාලන සේවා පනත යටතේ සාදන ලද පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදල් නියෝග යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් බවට ප්‍රකාශිත පළාත් පාලන සේවයේ තනතුරක් දරන්නකුව

සිටියා වූ ද එකී තනතුරේ හෝ තනතුරුවල ඔහුගේ සේවය සහ පළාතක පළාත් රාජ්‍ය සේවයේ හෝ පළාත් සභාවක ලේකම් කාර්ය මණ්ඩලයේ ඔහුගේ සේවය අඛණ්ඩව පැවතියා වූ ද අවස්ථාවක, ඒ එක් එක් තනතුර දරන්නාගේ සේවය, (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, විශ්‍රාම වැටුප් සහිත තනතුරක සේවය වශයෙන් සලකනු ලැබිය යුතු අතර, එම ව්‍යවස්ථා සංග්‍රහය ඒ අනුව අදාළ විය යුතු ය.

(4) යම් තැනැත්තකු, ඔහු හෝ ඔහුගේ කලත්‍රයා හෝ මව හෝ පියා පළාත් පාලන සේවයේ සහ පළාතක පළාත් රාජ්‍ය සේවයේ හෝ පළාත් සභාවක ලේකම් කාර්ය මණ්ඩලයේ තනතුරක් දැරීමේ හේතුවෙන් මේ පනත යටතේ විශ්‍රාම වැටුපකට හිමිකම් ලබා ඇති අවස්ථාවක, පළාත් පාලන සේවයේ ඔහුගේ හෝ ඔහුගේ කලත්‍රයාගේ හෝ මවගේ හෝ පියාගේ සේවා කාලය වෙනුවෙන් පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලින් හෝ පළාත් පාලන සේවා වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලින් හෝ පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලින් කිසිම විශ්‍රාම වැටුපක් ඔහුට ගෙවනු නොලැබිය යුතු ය.

(5) පළාතක පළාත් රාජ්‍ය සේවයේ හෝ පළාත් සභාවක ලේකම් කාර්ය මණ්ඩලයේ යම් තනතුරක් (1) වන උපවගන්තිය යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් වශයෙන් ප්‍රකාශ කරනු ලැබ ඇති අවස්ථාවක, මේ වගන්තියේ (2), (3) සහ (4) වන උපවගන්තිවල විධිවිධාන එම තනතුරු දැරූ සැම තැනැත්තකුටම, ඒ තැනැත්තා නියමිත දිනට කලින් එම තනතුරින් විශ්‍රාම ගෙන තිබුණත්, අදාළ විය යුතු ය.

අර්ථ නිරූපණය.

3. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි—

"පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල" යන්නෙන් ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතේ 16 වන වගන්තිය මගින් පිහිටුවන ලද පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල අදහස් වේ;

"පළාත් පාලන සේවා වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල" යන්නෙන් ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතේ 16 වන වගන්තිය මගින් පිහිටුවන ලද පළාත් පාලන සේවා වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල අදහස් වේ;

"පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතේ 16අ වගන්තිය මගින් පිහිටුවන ලද පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල අදහස් වේ ;

"පළාත" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අටවන උපලේඛනයේ දක්වා ඇති පළාතක් අදහස් වේ;

"පළාත් සභාව" යන්නෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVII අ පරිච්ඡේදය යටතේ පිහිටුවන ලද පළාත් සභාවක් අදහස් වේ.

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.